# දෙවන බස සිංහල

## 6 ශ්‍රේණිය

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

පළමුවන මුද්‍රණය 2014
දෙවන මුද්‍රණය 2015
තෙවන මුද්‍රණය 2016
සිව්වන මුද්‍රණය 2017
පස්වන මුද්‍රණය 2018
හයවන මුද්‍රණය 2019
හත්වන මුද්‍රණය 2020

සියලු හිමිකම් ඇවිරිණි.

ISBN 978-955-25-0265-1

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
පානළුව, පාදුක්ක පිහිටි රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදී.

Published by: Educational Publications Department
Printed by: State Printing Corporation, Panaluwa, Padukka.

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

ஒரு தாய் மக்கள் நாமாவோம்
ஒன்றே நாம் வாழும் இல்லம்
நன்றே உடலில் ஓடும்
ஒன்றே நம் குருதி நிறம்

அதனால் சகோதரர் நாமாவோம்
ஒன்றாய் வாழும் வளரும் நாம்
நன்றாய் இவ் இல்லினிலே
நலமே வாழ்தல் வேண்டுமன்றோ

யாவரும் அன்பு கருணையுடன்
ஒற்றுமை சிறக்க வாழ்ந்திடுதல்
பொன்னும் மணியும் முத்துமல்ல - அதுவே
யான்று மழியாச் செல்வமன்றோ.

**ஆனந்த சமரக்கோன்**
கவிதையின் பெயர்ப்பு.

# පෙරවදන

ලෝකය දිනෙන් දින සංවර්ධනය කරා පියමනින විට අධ්‍යාපන ක්ෂේත්‍රය ද සැමවිටම අලුත් වෙයි. එබැවින් අනාගත අභියෝග සඳහා සාර්ථක ලෙස මුහුණ දිය හැකි ශිෂ්‍ය ප්‍රජාවක් බිහිකරලීමට නම් අපගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ද නිරතුරුව සාධනීය ප්‍රවේශ වෙත ළඟාවිය යුතු ය. එයට සවියක් වෙමින් නවලොව දැනුම සමීප කරන අතරම, යහගුණයෙන් පිරිපුන් විශ්වීය පුරවැසියන් නිර්මාණය කිරීමට සහයවීම අපගේ වගකීම වේ. ඉගෙනුම් ආධාරක සම්පාදන කාර්යයෙහි සක්‍රිය ලෙස ව්‍යාවෘත වෙමින් අප දෙපාර්තමේන්තුව ඒ සඳහා දායක වනුයේ දූයේ දරුවන්ගේ නැණ පහන් දල්වාලීමේ උතුම් අදිටනෙනි.

පෙළපොතක් යනු දැනුම පිරි ගබඩාවකි. එය විටෙක අප වින්දනාත්මක ලොවකට කැඳවාගෙන යන අතරම තර්ක බුද්ධිය ද වඩවාලයි. සැඟවුණු විභව්‍යතා විකසිත කරවයි. අනාගතයේ දිනෙක, මේ පෙළපොත් හා සබැඳි ඇතැම් මතක, ඔබට සුවයක් ගෙන දෙනු ඇත. මේ අනගි ඉගෙනුම් උපකරණයෙන් ඔබ නිසි පල ලබාගන්නා අතරම තව තවත් යහපත් දැනුම් අවකාශ වෙත සමීප වීම ද අනිවාර්යයෙන් සිදු කළ යුතු ය. නිදහස් අධ්‍යාපනයේ මහරු තිළිණයක් ලෙස නොමිලේ මේ පොත ඔබේ දෝතට පිරිනැමේ. පාඨ ග්‍රන්ථ වෙනුවෙන් රජය වැය කර ඇති සුවිසල් ධනස්කන්ධයට අගයක් ලබා දිය හැක්කේ ඔබට පමණි. මෙම පෙළපොත හොඳින් පරිශීලනය කර නැණ ගුණ පිරි පුරවැසියන් වී හෙට ලොව එළිය කරන්නට ඔබ සැමට දිරිය සවිය ලැබෙන්නැයි සුබ පතමි.

මෙම පෙළපොත් සම්පාදන සත්කාර්යය වෙනුවෙන් අප්‍රමාණ වූ දායකත්වයක් සැපයූ ලේඛක, සංස්කාරක හා ඇගයුම් මණ්ඩල සාමාජික පිරිවරටත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයටත් මාගේ ප්‍රණාමය පළකරමි.

**පී. එන්. අයිලප්පෙරුම,**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව,
ඉසුරුපාය,
බත්තරමුල්ල.
2020. 06. 26

## නියාමනය හා අධීක්ෂණය

පී.එන්. අයිලප්පෙරුම - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## මෙහෙයවීම

ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි - කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## සම්බන්ධීකරණය

ටී. එම්. එස්. තෙන්නකෝන් - නියෝජ්‍ය කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

ඩී. එම්. මල්කා මිලානි - සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## සංස්කාරක මණ්ඩලය

1. මහාචාර්ය රත්න විජේතුංග - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2. එස්. එම්. ඒ. සිෆායා - නියෝජ්‍ය අධ්‍යක්ෂිකා, අධ්‍යාපන අමාත්‍යාංශය
3. ඩබ්. පී. මංගල ගුණරත්න - සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම

## ලේඛක මණ්ඩලය

1. වයි.පී.එම්. පී. විමලසිරි - ගුරු උපදේශිකා, කලාප අධ්‍යාපන කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර

2. ඩී. එච්. කාසිම් - ගුරු සේවය, කො/ මෙතෝදිස්ත විද්‍යාලය, දෙහිවල

3. විනීතා කුලතිලක - ගුරු සේවය, ක/ ශ්‍රී පාලි විද්‍යාලය, හොරණ

4. ටී. පී. ඇරැගොඩ - ගුරු සේවය, මහ/ කැටබුලා දෙමළ විද්‍යාලය, කැටබුලාව

5. ඩබ්. එස්. නිල්මිණී ප්‍රියංකා - ගුරු සේවය, හ/ නෙතොල්පිටිය ගැමුණු විද්‍යාලය, තංගල්ල

## භාෂා සංස්කරණය

1. මහාචාර්ය කේ.එන්. ඕ. ධර්මදාස - පේරාදෙණිය විශ්වවිද්‍යාලය
2. මහාචාර්ය තිස්ස ජයවර්ධන - කොළඹ විශ්වවිද්‍යාලය

## සෝදුපත් කියවීම

මහාචාර්ය තිස්ස ජයවර්ධන - කොළඹ විශ්වවිද්‍යාලය

## චිත්‍ර සහ පිටකවර නිර්මාණය

කේ. ඒ. සමන් කලුබෝවිල - ග/ අනුර මධ්‍ය මහා විද්‍යාලය, යක්කල

## පරිගණක අක්ෂර සංයෝජනය

ජී. ඩබ්. ශෂිකා මධුමාලි - පරිගණක අංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

# ලේඛක/සංස්කාරක මණ්ඩල සටහන

විෂය නිර්දේශයේ අරමුණු, විෂය අභිමතාර්ථ, භාෂාත්මක අන්තර්ගතය, ඉගෙනුම් ක්‍රමෝපායයන්, සමාජ සංස්කෘතික පදනම යනාදිය මත සරල ව මෙහි එන පාඩම් නිර්මාණය කර ඇත.

අකුරු සහ පිල්ලම් භාවිතය පිළිබඳ සරල ප්‍රවේශයක් ද අන්තර්ගත කිරීමෙන් දෙවන භාෂාවක් ලෙස සිංහල භාෂාව ඔබට හැදෑරීම පහසුවක් වනු ඇත. ලොව විවිධ රටවල ද්විභාෂා පරිහරණය පිළිබඳ නිරීක්ෂණයන් ද ප්‍රයෝජනයට ගෙන සියලු පාඩම් නිර්මාණය කර ඇත.

දැනට අප භාවිත කරන නිපුණතා ප්‍රවේශයට පාදක වන හෙළ බසේ ගති සොබා හා හැඩරුව කෙරෙහි විශේෂත්වයක් දැක්වීම මත පාඩම්වල අන්තර්ගත වචන, වචන මාලාවකට ගොනුකර ඒවා දමිළ භාෂාවෙන් ද සඳහන් කර ඇත.

නිපුණතාවලට අනුකූල ව ගොඩනැගුණු පාඩම් අවසානයේ, ක්‍රියාකාරකම් ප්‍රවේශයන් ද දමිළ භාෂාවෙන් දීම කාලීන භාෂාමය කාර්යයන් සඵල කර ගැනීමට මහඟු පිටිවහලක් වේ.

භාෂක සමාජ අතර එදිනෙදා අවශ්‍යතා ඉටුකර ගැනීමේ දී පැන නැගෙන අභියෝග ජය ගැනීම සඳහා අවස්ථානුකූල ව භාෂාව හසුරවමින් සන්නිවේදන ශක්‍යතා ගොඩනගා ඇත.

සිංහල සංස්කෘතිය හා සංස්කෘතික උරුමයන්, දායාද, වටිනාකම්, අගයන් පිළිබඳ දැනුම හා අවබෝධය ඇති කර ගනිමින් අභිමානවත් ශ්‍රී ලාංකික ජාතියක් ගොඩ නැගීම මෙම පොතෙහි අරමුණ වේ.

# පටුන


| | | පිටුව |
|---|---|---|
| | අකුරු ඉගෙන ගනිමු | 1 |
| | පිල්ලම් ඉගෙන ගනිමු | 6 |
| 01 | මේ මමයි | 8 |
| 02 | පාසල් යමු | 14 |
| 03 | තාත්තා එනවා | 22 |
| 04 | කුමාරිගෙන් ලියුමක් | 28 |
| 05 | හාවා නැටුම් පෑවා | 34 |
| 06 | නුවර මාමා එනවා | 41 |
| 07 | වැස්සක් එන්නේ | 48 |
| 08 | පූසා හැංගිලා | 53 |
| 09 | අපි පොළට යමු | 59 |
| 10 | යාපනේ මිදි | 67 |
| 11 | පිපාසිත කපුටා | 76 |
| 12 | දුම්රියෙන් ගමනක් | 85 |





පිවිසෙන්න නිදහසේ සතුටින් දැනුම සොයා.. e-තක්සලාව The National e-learning Portal for the General Education ට... www.e-thaksalawa.moe.gov.lk




# අකුරු ඉගෙන ගනිමු









රඹුටන්










ටයරය










ගහ










හය






මල




ව

වට්ටක්කා




ච

චතුරස්‍ර



ල

ලණුව



ද

දර




ප



පහන



ජ



ජම්බු





යතුර





සමනලයා





කුඩය









බසය








නංගී





තරුව










කපුටා









ඊතලය









ඉදිආප්ප










උදැල්ල









එක










ඔරුව









අම්මා










ආච්චි










ඇපල්



# පිල්ලම් ඉගෙන ගනිමු

| | | | |
|---|---|---|---|
| ා | මා | මාමා |  |
| ැ | අැ | අැස |  |
| ෑ | පෑ | පෑන |  |
| ි | නි | නිවස |  |
| ී | සී | සීයා |  |
| ු | පු | පුටුව |  |
| ු | කු | කුඩය |  |

| | | | |
|---|---|---|---|
| ූ | පූ | පූසා |  |
| ූ | කූ | කූඩය |  |
| ෙ | ෙ | පෙට්ටිය |  |
| ් | ක් | අක්කා |  |
| ් | ට් | වට්ටක්කා |  |
| ්‍ර | ග්‍ර | ග්‍රහලෝක |  |

# 01 මේ මමයි

ආයුබෝවන් ළමයි.

ආයුබෝවන් ගුරුතුමී.

අද අපට අලුත් යාළුවෙක් . . .


අපි එයා ගැන අහමු.

මුලින් ම මා ගැන කියන්නම්.

මගේ නම දීපානි.

මගේ වයස අවුරුදු විසි අටයි.

මගේ ගම කොග්ගල.



අපි දැන් අලුත් යාළුවා ගැන අහමු.

මගේ නම සහන්.

මම ඉගෙන ගන්නෙ හයේ **පන්තියේ.**

මගේ වයස අවුරුදු එකොළහයි.

මගේ ගම මතුගම.



ආ . . . දැන් කුමාරි කියන්න



මම කුමාරි.

මට අවුරුදු එකොළහයි.

මගේ **පාසල** සීතාවක මහා විද්‍යාලය.

මගේ **ගම** මල්වාන.

## ✍ ක්‍රියාකාරකම 01



**මා ගැන කියමු.**

என்னைப் பற்றிக் கூறுவோம்.



i මගේ නම ....................................

ii මගේ වයස ....................................

iii මගේ පන්තිය ....................................

iv මගේ පාසල ....................................

v මගේ ගම ....................................

## ✍ ක්‍රියාකාරකම 02



**නම කියමු.**

பெயரைக் கூறுவோம்.



i මම .................

ii මගේ නම .................

iii ................. මගේ නම

## ✍ ක්‍රියාකාරකම 03



**තොරතුරු කියමු.**

தகவல்களை கூறுவோம்.

මගේ යාළුවා ගැන කියමු.

எனது நண்பனைப் பற்றி கூறுவோம்.



i යාළුවාගේ නම ....................

ii යාළුවාගේ වයස ....................

iii යාළුවාගේ පාසල ....................

iv යාළුවාගේ ගම ....................

## ✍ ක්‍රියාකාරකම 04



**මගේ මල්ලී ගැන කියමු.**

எனது தம்பியைப் பற்றி கூறுவோம்.



i මල්ලීගේ නම ..................

ii මල්ලීගේ වයස ..................

iii මල්ලීගේ පන්තිය ..................

iv මල්ලීගේ පාසල ..................

## ✍ ක්‍රියාකාරකම 05



### I බලා ලියමු. කියවමු.

*பார்த்து எழுதுவோம். வாசிப்போம்.*

i මම ..............................

ii මා ..............................

iii මගේ ..............................

iv මට ..............................

v මගෙන් ..............................



### II ගුරුතුමී ගැන කියමු. ලියමු.

*ஆசிரியைப் பற்றி கூறுவோம். எழுதுவோம்.*



i ගුරුතුමීගේ නම ......................

ii ගුරුතුමීගේ ගම ......................

iii ගුරුතුමීගේ වයස ......................

iv ගුරුතුමීගේ පාසල ......................

v ගුරුතුමීගේ විෂය ......................

# වචන මාලාව.

| | | |
|---|---|---|
| මගේ | - | என்னுடைய |
| නම | - | பெயர் |
| වයස | - | வயது |
| පන්තියේ | - | வகுப்பில் |
| පාසල | - | பாடசாலை |
| ගම | - | ஊர் |



# 02 පාසල් යමු




පුතා නැගිටින්න.

ඉස්කෝලෙ යන්න ඕනෙ.

එන්න.

ඉක්මනට එන්න.

මූණ සෝදන්න.



පුතා එන්න තේ බොන්න.

සීයා එන්න.

ආච්චි එන්න.

තාත්තා එන්න.

ඉඳගන්න.

කෑම කන්න.

කන්න මේ කිරිබත්.

ඉඳිආප්ප, පිට්ටු කන්න.

කෙසෙල් ගෙඩි කන්න.

කැවුම් කන්න.

අලුවා කන්න.

තේ බොන්න.



පුතා වඳින්න.

ආච්චිට වඳින්න

අම්මාට, තාත්තාට

සීයාට වඳින්න.

වතුර බෝතලය ගන්න.

මූඩිය හොඳට වහන්න.

බෑග් එක ගන්න.

ලේන්සුව ගන්න.


තොප්පිය ගන්න.


අපි පාසල් යමු.

## ✍ ක්‍රියාකාරකම 01

**හඳුනා ගනිමු. යා කරමු.**

*அறிந்துகொள்வோம். இணைப்போம்.*


i  කෙසෙල් ගෙඩි

ii  කැවුම්

iii  අලුවා

iv  කිරිබත්


v  පිට්ටු


vi  ඉඳිආප්ප

## ✍ ක්‍රියාකාරකම 02

**රූපය බලා කියවමු.**

*படத்தைப் பார்த்து வாசிப்போம்.*

i  කිරිබත් / කැවුම් කන්න.

ii  කොකිස් /කෙසෙල් ගෙඩි කන්න.

iii  බෑග් එක / වතුර බෝතලය ගන්න

iv  ආච්චිට / සීයාට වඳින්න.

v  පන්සලට / පාසලට යන්න.

## ✍ ක්‍රියාකාරකම 03



**මෙසේ කියවමු.**

இவ்வாறு வாசிப்போம்.

**උදාහරණ :- අම්මා කිරිබත් කන්න.**

i




ii



iii




## ✍ ක්‍රියාකාරකම 04



**ගළපමු. කියවමු.**

இணைப்போம். வாசிப்போம்.

**උදාහරණ :- පුතා කැවුම් කන්න.**

| | | |
|---|---|---|
| තාත්තා | කැවුම් | කන්න |
| ආච්චි | කොකිස් | |
| අම්මා | කිරිබත් | |
| සීයා | අලුවා | |
| පුතා | ඉඳිආප්ප | |

## ✍ ක්‍රියාකාරකම 05

**හඳුනා ගනිමු. කියවමු. ලියමු.**

*அறிவோம். வாசிப்போம். எழுதுவோம்.*



i එන්න

ii යන්න

iii ගන්න

iv කන්න

v බොන්න

vi නැගිටින්න

vii ඉඳගන්න

viii වඩින්න



# වචන මාලාව.

| | | |
|---|---|---|
| නැගිටින්න | - | எழும்புங்கள் |
| මූණ | - | முகம் |
| සෝදන්න | - | கழுவுங்கள் |
| එන්න | - | வாருங்கள் |
| තාත්තා | - | அப்பா |
| ඉඳගන්න | - | உட்காருங்கள் |
| කන්න | - | சாப்பிடுங்கள் |
| ඉඳිආප්ප | - | இடியப்பம் |
| කෙසෙල් ගෙඩි | - | வாழைப்பழம் |
| අම්මා | - | அம்மா |



# 03 තාත්තා එනවා



අම්මා! අම්මා!

එන්න.

අන්න තාත්තා. . .

තාත්තා එනවා.

නංගී,

ඉක්මනට එන්න.

තාත්තා එනවා.

අක්කා එන්න.

අයියා?

අයියා කෝ?

අයියා ඉන්නවා.

බස් එක යනවා.

තාත්තා . . . පොත?

පොත ගෙනාවා.

හරි ලස්සනයි.



## ✍ ක්‍රියාකාරකම 01

**සුදුසු අකුර යොදමු. කියවමු.**

*பொருத்தமான எழுத்தை இடுவோம். வாசிப்போம்.*


i අ...මා

ii තා...තා

iii එ...න

iv ල...සන

v ඉ...මනට



## ✍ ක්‍රියාකාරකම 02

**රූපය බලා තෝරමු. කියවමු.**

படத்தைப் பார்த்துத் தெரிவு செய்வோம். வாசிப்போம்.

i  **තාත්තා** - එනවා /යනවා/ඉන්නවා

ii  **අයියා** - එනවා /යනවා/ඉන්නවා

iii  **අම්මා** - එනවා/යනවා/ඉන්නවා

iv  **මල්ලී** - එනවා /යනවා/ඉන්නවා


v  **පොත** - ඉන්නවා/ තියෙනවා

## ක්‍රියාකාරකම 03



**ගළපමු. කියවමු.**

சேர்ப்போம். வாசிப்போம்.




## ක්‍රියාකාරකම 04



**යා කරමු. කියවමු.**

இணைப்போம். வாசிப்போம்.

| | | |
|---|---|---|
| i | තාත්තා | ඉන්නවා |
| ii | අයියා | තියෙනවා |
| iii | බස් එක | ඇහෙනවා |
| iv | සද්දේ | යනවා |
| v | පොත | එනවා |

## ✍ ක්‍රියාකාරකම 05

### අකුරු ලියමු.

எழுத்துக்களை எழுதுவோம்.

යනවා ........ නවා ........ නවා ........ නවා

........ ........ ........ ........................

### "ය" යෙදෙන වචන ලියන්න.

''ய'' எழுத்து வரும் சொற்களை எழுதுங்கள்.

i ........................

ii ........................

iii ........................

බසය බ........ය බ........ය බ........ය

........ ........ ........ ........................

### "ස" යෙදෙන වචන ලියන්න.

''ச'' எழுத்து வரும் சொற்களை எழுதுக.

i ........................

ii ........................

iii ........................



# වචන මාලාව.



| | | |
|---|---|---|
| නංගී | - | தங்கை |
| එනවා | - | வருகிறார் |
| අක්කා | - | அக்கா |
| අයියා | - | அண்ணா |
| පොත | - | புத்தகம் |
| තාත්තා | - | அப்பா |
| අම්මා | - | அம்மா |
| ඉන්නවා | - | இருக்கிறார் |
| අන්න | - | அதோ |

# 04 කුමාරිගෙන් ලියුමක්



අම්මේ, අම්මේ.

ලියුමක්.

කාට ද පුතා?

අක්කාට,



අනේ දෙන්නකො මල්ලී.

ආ . . . මෙන්න.

**සුබ පැතුම් පතක්**

හරි ම ලස්සනයි.

කොහෙන් ද අක්කේ?

නුවරින්.

කාගෙන් ද?

කුමාරිගෙන්.

බලමු, බලමු.


ආදරණීය කවිතාට,

සුබ උපන් දිනයක් වේවා !

කුමාරි.



## ✍ ක්‍රියාකාරකම 01



**සුබ පැතුම් පත කියවමු.**

நல் வாழ்த்து அட்டையை வாசிப்போம்.

ආදරණීය සමන්ට,

සුබ උපන් දිනයක් වේවා!

රවි.

## ✍ ක්‍රියාකාරකම 02

**කියවමු.**

வாசிப்போம்.



උදා :- අම්මාට සුබ උපන් දිනයක් වේවා!

- අම්මාට
- තාත්තාට
- ගුරුතුමීට
- ඔයාට
- නංගීට
- කමල්ට
- කවිතාට
- මල්ලීට

→ සුබ උපන් දිනයක් වේවා!

## ✍ ක්‍රියාකාරකම 03



### කියවමු. ලියමු.

வாசிப்போம். எழுதுவோம்.

සුබ පැතුම් පත

- කාගෙන් ද?
- කාට ද?
- අක්කාට ද?
- කොහෙන් ද?
- නුවරින් ද?



## ✍ ක්‍රියාකාරකම 04



### කියවමු.

வாசிப்போம்.

| | | | |
|---|---|---|---|
| i | සුබ දිනයක් | = | සුබ දිනයක් වේවා! |
| ii | සුබ අලුත් අවුරුද්දක් | = | සුබ අලුත් අවුරුද්දක් වේවා! |
| iii | සුබ නත්තලක් | = | සුබ නත්තලක් වේවා! |
| iv | ජය වේවා | = | ජය වේවා! |

## ✍ ක්‍රියාකාරකම 05

### I සුබ පැතුම් පතක් හදමු.

வாழ்த்து அட்டை ஒன்றினைத் தயாரிப்போம்.

**අලුත් අවුරුද්දක්, නත්තලක්, උපන් දිනයක් . . .**

ආදරණීය ..............................

සුබ ............................................. වේවා!



..............................

### II කියවමු. ලියමු.

வாசிப்போம். எழுதுவோம்.



<table>
<tr><td>තාත්තාට</td><td rowspan="2">සෙත් වේවා!</td></tr>
<tr><td>අම්මාට</td></tr>
<tr><td>කමල්ට</td><td rowspan="2">ජය වේවා!</td></tr>
<tr><td>කවිතාට</td></tr>
<tr><td>ඔයාට</td><td rowspan="2">සුබ උපන් දිනයක් වේවා!</td></tr>
<tr><td>නංගීට</td></tr>
<tr><td>මල්ලීට</td><td rowspan="2">සුබ නත්තලක් වේවා!</td></tr>
<tr><td>ගුරුතුමීට</td></tr>
</table>

# වචන මාලාව.

සුබ පැතුම් පතක් - வாழ்த்து அட்டை ஒன்று

කාගෙන් ද? - யாரிடமிருந்து ?

සුබ උපන් දිනයක් වේවා! - பிறந்தநாள் வாழ்த்துக்கள் !

සුබ - நல்ல

ජය වේවා! - வெற்றி பெறுக !

සෙත් වේවා! - நலம் உண்டாகட்டும் !

සුබ නත්තලක් වේවා! - நத்தார் வாழ்த்துக்கள் !

ආයුබෝවන් - வணக்கம்




# 05 හාවා නැටුම් පෑවා

හා හා හරි හාවා
කැලේ මැදින් ආවා
හිටගෙන ගඟ ගාවා
වටපිට ඇහැ ලෑවා

කොළ දෙකටක් කෑවා
පැන් උගුරක් බීවා
තොල කට ලෙව කෑවා
ඉතින් ඇතැයි කීවා

තබා නිකට ගාවා
වීණාවක් ගෑවා
මිහිරි සින්දු කීවා
නැටුම් ටිකක් පෑවා




## ✍ ක්‍රියාකාරකම 01


I කියවමු.

*வாசிப்போம்.*


i




ii



iii




## II වචන ලියමු.

சொற்களை எழுதுவோம்.



| | | | |
|---|---|---|---|
| i | ආවා | vi | ...................... |
| ii | ...................... | vii | ...................... |
| iii | ...................... | viii | ...................... |
| iv | ...................... | ix | ...................... |
| v | ...................... | x | ...................... |

## ✍ ක්‍රියාකාරකම 02



**යා කරමු. කියවමු.**

இணைப்போம். வாசிப்போம்.

හාවා

- කොළ දෙකටක්
- පැන් උගුරක්
- වීණාවක්
- කැළේ මැදින්
- නැටුම් ටිකක්

පැවා

බීවා

ගැවා

ආවා

කෑවා

## ✍ ක්‍රියාකාරකම 03



**හිස්තැන් පුරවමු. කියවමු.**

வெற்றிடங்களை நிரப்புவோம். வாசிப்போம்.



කොළ දෙකටක් .........

පැන් උගුරක් .........

තොල කට ලෙව .........

මිහිරි සින්දු .........

ඉතින් ඇතැයි .........

## ✍ ක්‍රියාකාරකම 04

**හිස්තැන් පුරවමු.**

வெற்றிடங்களை நிரப்புவோம்.



i　පැන් උ.....රක් බීවා

ii　තබා නි.....ට ගාවා

iii　වීණාවක් ..... වා

iv　මිහිරි .....න්දු කීවා

v　නැ.....ම් ටිකක් පෑවා

## ✍ ක්‍රියාකාරකම 05

**දී ඇති අකුරු බලමු. ලියමු.**

தரப்பட்டுள்ள எழுத்துக்களை பார்ப்போம். எழுதுவோம்.

i　කට , දෙකට , නිකට , වට පිට

ට　.......... .......... .......... .......... ..........

ii　හා හා හරි හාවා

හා　.......... .......... .......... .......... ..........

වා　.......... .......... .......... .......... ..........

iii　බීවා , කීවා , වීණාවක් , දීවා

බී　.......... .......... .......... .......... ..........

කී .......... .......... .......... .......... ..........

වී .......... .......... .......... .......... ..........

දී .......... .......... .......... .......... ..........

iv කැළේ, මැදින්, ඇතැයි, ඇහැ , ඇතැයි , නැටුම්

කැ .......... .......... .......... .......... ..........

මැ .......... .......... .......... .......... ..........

ඇ .......... .......... .......... .......... ..........

හැ .......... .......... .......... .......... ..........

තැ .......... .......... .......... .......... ..........

නැ .......... .......... .......... .......... ..........

v කෑවා, ලෑවා, පෑවා, ගෑවා

කෑ .......... .......... .......... .......... ..........

ලෑ .......... .......... .......... .......... ..........

පෑ .......... .......... .......... .......... ..........

ගෑ .......... .......... .......... .......... ..........

# වචන මාලාව.

| | | |
|---|---|---|
| හාවා | - | முயல் |
| කැලේ | - | காட்டில் |
| නිකට | - | நாடி |
| සින්දු | - | பாடல்கள் |
| නැටුම් | - | நடனங்கள் |
| මැදින් | - | நடுவே |
| හිටගෙන | - | நின்று கொண்டு |
| වීණාවක් | - | வீணையொன்று |
| කට | - | வாய் |



# 06 නුවර මාමා එනවා




ආයුබෝවන් . . . කවුද කතා කරන්නේ?

පුතේ මම, ලොකු මාමා

ඔයාලගේ අලුත් ගෙදරට එන පාර කියන්න.

මාමා දැන් **ඉන්නේ** කොහේ ද?






ගාල්ල දුම්රිය පොළ **ඉස්සරහ**.

හොඳයි, මාමේ

දුම්රිය පොළ ඉස්සරහ තියෙන

කොටුව පාර දිගේ එන්න.

**මීටර් සීයක්** විතර එන්න.

පාර අයිනෙ **ලොකු අඹ ගහක්** තියෙනවා.

**එතනින් දකුණට** හැරෙන්න.

**වම් පැත්තේ** කහ පාට තාප්පයක් තියෙනවා.



ඒක තමා අපේ ගෙදර.

හරි මම එන්නම් **පුතේ**.

මාමා එන්න.

මම ගේට්ටුව ළඟ ඉන්නම්.

## ✍ ක්‍රියාකාරකම 01

**පිළිතුරු සොයමු.**

விடைகளைக் கண்டுபிடிப்போம்.

| |
|---|
| මීටර් සීයක්, ලොකු මාමා, කහ පාටයි, දකුණට, දුම්රිය පොළ ඉස්සරහ |

i මාමා ඉන්නේ කොහේ ද?

ii දුම්රිය පොළේ සිට කොපමණ දුර ද?

iii කතා කරන්නේ කවුද?

iv තාප්පය මොන පාට ද?

v හැරෙන්නේ කොයි පැත්තට ද?



## ✍ ක්‍රියාකාරකම 02



**යා කරමු. කියවමු.**

இணைப்போம். வாசிப்போம்.

i ආයුබෝවන් කතා කරන්නේ

ii ගෙදරට එන්නේ

iii එතනින් දකුණට

iv ඔයාලගේ ගේ

v කොටුව පාර දිගේ

| |
|---|
| එන්න |
| කොයික ද? |
| හැරෙන්න |
| කොහොම ද? |
| කවුද? |

## ✍ ක්‍රියාකාරකම 03

### I අකුරු යොදමු. කියවමු.

எழுத்துக்களை இடுவோம். வாசிப்போம்.

| | | |
|---|---|---|
| i | තා__ පය | ප/ප් |
| ii | ගා__ල | ල්/ලි |
| iii | ක__පාට | අ/හ |
| iv | __ට්ටුව | කේ/ගේ |
| v | ගෙ__ර | ද/ත |



### II හිස් තැන් පුරවමු. කියවමු.

வெற்றிடங்களை நிரப்புவோம். வாசிப்போம்.

**හො, පැ, හ, හො, හේ**

i වම් .....ත්තේ

ii කො.......ද

iii කො.......ම ද

iv ක..... පාට


v .......ඳයි




## ✍ ක්‍රියාකාරකම 04

**කියවමු. ලියමු.**
வாசிப்போம். எழுதுவோம்.

i




ii උදාහරණ :- එතනින් වමට මීටර් සීයක් විතර එන්න.



## ✍ ක්‍රියාකාරකම 05

**වගන්ති හදමු. කියවමු.**

*வசனங்களை அமைப்போம். வாசிப்போம்.*

i





ii උදාහරණ :- වම් පැත්තේ අඹ ගහක් තියෙනවා.



# වචන මාලාව.

| | | |
|---|---|---|
| ඔයාලගේ | - | உங்களுடைய |
| ඉන්නේ ඉස්සරහ | - | முன்னால் இருக்கிறேன் |
| මාමේ | - | மாமா |
| මීටර් සීයක් | - | நூறு மீற்றர் |
| ලොකු | - | பெரிய |
| අඹ ගහක් | - | ஒரு மாமரம் |
| එතනින් | - | அங்கே இருந்து |
| දකුණට | - | தெற்கிற்கு |
| වම් පැත්තේ | - | இடப்பக்கத்தில் |
| පුතේ | - | மகனே |
| ගේට්ටුව | - | வாயில் |
| තියෙන | - | உள்ள |



# 07 වැස්සක් එන්නේ

අම්මේ . . . අන්න. . අන්න. අහස කළු වෙලා.
හුළං හමනවා. විදුලි කොටනවා.
සද්දෙ ඇහෙනවා.
මහ වැස්සක් එනවා.
තාත්තායි මල්ලියි
පාරට ගියා
බලන්න දුව.
මල්ලී . . . මල්ලී
ලොකු පුතා
කුඩේ ගන්න
ඉක්මනට දුවන්න.
මල්ලියි තාත්තායි පාරේ.
හොඳයි අම්මේ මම යන්නම්.
දුව, ඉක්මනට එන්න.
වැලේ රෙදි ටික ගන්න.
මම,
දර ටික ගෙට ගන්නම්.



## ✍ ක්‍රියාකාරකම 01



**කියවමු. ලියමු.**

வாசிப்போம். எழுதுவோம்.

පුතා → එන්න
මල්ලී → එන්න
අම්මා → එන්න
දුව → එන්න
තාත්තා → එන්න
අයියා → එන්න




## ✍ ක්‍රියාකාරකම 02




**ගළපමු. කියවමු.**

பொருத்துவோம். வாசிப்போம்.



## ✍ ක්‍රියාකාරකම 03

**ගළපමු. කියවමු.**
சேர்ப்போம். வாசிப்போம்.




## ✍ ක්‍රියාකාරකම 04

**හිස්තැන් පුරවමු. කියවමු.**
இடைவெளிகளை நிரப்புவோம். வாசிப்போம்.

| පාරට, කළු, ඉක්මනට, වැස්සක්, කුඩේ |
|---|

i අහස ............................ වෙලා.

ii මහ ............................ එනවා.

iii තාත්තයි මල්ලියි ............................ ගියා.

iv ලොකු පුතා ............................ ගන්න.

v දුව ............................ එන්න.



## ක්‍රියාකාරකම 05

**ගයමු.**

*பாடுவோம்.*

වැස්ස වහිනවා

මිදුලේ

වතුර පිරෙනවා//

වැටෙන වතුර

අල්ලන කොට

අම්මා

බනිනවා. . .

කුඩේ ගන්නවා//

අම්මා

කඩේට යනවා

මටත් කුඩේ

අරන් කඩේ

යන්න හිතෙනවා . . .//



# වචන මාලාව.

| | | |
|---|---|---|
| අහස | - | வானம் |
| කළු වෙලා | - | கரு நிறமாகிவிட்டது |
| වැස්සක් | - | மழையொன்று |
| පාරට | - | பாதைக்கு |
| දුව | - | மகள் |
| දුවන්න | - | ஓடுங்கள் |
| තාත්තායි | - | அப்பாவும் |
| කුඩේ | - | குடை |
| එනවා | - | வருகிறார் |
| ඇහෙනවා | - | கேட்கிறது |



# 08

# පූසා හැංගිලා



පූස් . . . පූස් . . .

කෝ පූසා?

පූසා කොහේ ද?

උෟ හැංගිලා.



බලු පැටියා ඉන්නවා.

පූසා කෝ?



ඇඳ යට ද?

සෙල්ලම් බඩු පෙට්ටියේ ද?

රෙදි කූඩෙ ද?



එළියෙ ඉන්නවා ද?

පූසා කොහේ ද හැංගිලා.

බලු පැටියා ගහ යට.

පූසා ගහ උඩ.

පූස් . . . පූස් . . . බිමට බහින්න.

## ✍ ක්‍රියාකාරකම 01

**කියවමු.**

வாசிப்போம்.



i පූසා කෝ?

ii ඇඳ යට ද?

iii සෙල්ලම් බඩු පෙට්ටියේ ද?

iv රෙදි කූඩෙ ද?

v එළියෙ ඉන්නවා ද?

## ✍ ක්‍රියාකාරකම 02

**අසමු. කියවමු.**

கேட்போம். வாசிப்போம்.



i පූසා කෝ? → ඌ හැංගිලා / ඌ ගහ උඩ

ii බලු පැටියා කෝ? → ඌ ඉන්නවා / ඌ ගහ යට

iii පූසා කෝ? → ඌ ඇඳ යට / ඌ රෙදි කූඩෙ

## ✍ ක්‍රියාකාරකම 03



**යා කරමු.**

*படங்களை இணைப்போம்.*

i 

පූසා ගහ උඩ

ii 


බලු පැටියා ගහ යට

iii 

පූසා රෙදි කූඩෙ ද?

iv 

පූසා සෙල්ලම් බඩු පෙට්ටියේ ද?

v 

පූසා ඇඳ යට ද?


## ක්‍රියාකාරකම 04



### වාක්‍ය හදමු. කියවමු.

வசனங்களை அமைப்போம். வாசிப்போம்.

උදාහරණ :- පූසා ගහ උඩ හැංගිලා ද?




## ක්‍රියාකාරකම 05

### I හිස්තැන් පුරවමු.

வெற்றிடங்களை நிரப்புவோம்.

i සෙ...ලම් බඩු පෙ...ටියේ ද?

ii බලු පැ...යා කො... ද?

iii ...සා රෙදි ...ඩෙ ද?

iv ...ඳ යට ...ංගිලා ද?

v ...මට බ...න්න

ටි ල් පූ බි කූ හි ට් හැ ඇ හේ

## II  ලියමු. කියවමු.

எழுதுவோம். வாசிப்போம்.

i කෝ ? - ...............................

ii කොහේ ද ? - ...............................

iii උඩ ද ? - ...............................

iv යට ද ? - ...............................

v එළියෙ ද ? - ...............................

vi පෙට්ටියේ ද ? - ...............................

vii කූඩෙ ද ? - ...............................



# වචන මාලාව.

| | | |
|---|---|---|
| කෝ | - | எங்கே |
| පූසා | - | பூனை |
| උෟ | - | அது |
| කොහේ ද? | - | எங்கே |
| ඇඳ යට | - | கட்டிலுக்கு கீழே |
| පෙට්ටියේ | - | பெட்டியில் |
| කූඩෙ | - | கூடையில் |
| ගහ උඩ | - | மரத்தின் மேலே |



# 09 අපි පොළට යමු

ලාබයි. . . ලාබයි . . . එන්න, එන්න.

ගමේ එළවළු, ගමේ පලතුරු

ගන්න ගන්න, හරි ම රසයි, හරි ම ගුණයි

ගමේ එළවළු, ගමේ පලතුරු



මුදලාලි වට්ටක්කා කීය ද?

ග්‍රෑම් **පන්සීය** රුපියල් විස්සයි.

හරි, ග්‍රෑම් පන්සීයක් දෙන්න.

වම්බටු කීය ද?

**කිලෝ එකක් තිහයි.**

කිලෝ එකක් දෙන්න.



මුරුංගා?

මිටියක් විස්සයි.

මිටි දෙකක් ම දෙන්න.

**අඹ, කෙසෙල් ගෙඩි, අන්නාසි. . .**

**පැපොල්, ජම්බු, පේර, ඇපල්, මිදි. . .**



අන්න අම්මේ දොඩම්,

**ගෙඩියක් කීය ද?**

දහයයි.

**ගෙඩි දෙකක් දෙන්න.**

මුදලාලි, ගාන කීය ද?

විස්සයි... තිහයි... හතළිහයි... විස්සයි...

එකසිය දහයක් දෙන්න.

මෙන්න සල්ලි ගන්න.

ආ... මෙන්න ඉතුරු සල්ලි.

## ✍ ක්‍රියාකාරකම 01





**හඬ නගා කියවමු.**


*உரத்து வாசிப்போம்.*

i  → වට්ටක්කා

ii  → මුරුංගා

iii  → දොඩම්

iv  → අඹ

v  → වම්බටු

## ✍ ක්‍රියාකාරකම 02



**ගළපා කියවමු.**

*சேர்த்து வாசிப்போம்.*

i වට්ටක්කා කිලෝ එකක්

ii වම්බටු කිලෝ එකක්

iii මුරුංගා මිටියක්

iv දොඩම් ගෙඩියක්

v අඹ ගෙඩියක්


→ කීය ද?


## ✍ ක්‍රියාකාරකම 03


### I පින්තූරය බලා කියවමු.


*படத்தைப் பார்த்து வாசிப்போம்.*




i මට  පන්සියක් දෙන්න.

ii මට  කිලෝ එකක් දෙන්න.

iii මට  මිටියක් දෙන්න.

iv මට  ගෙඩියක් දෙන්න.

v මට  ගෙඩි දෙකක් දෙන්න.


II  **පින්තූරය බලා කියවමු.**

படத்தைப் பார்த்து வாசிப்போம்.

i  පන්සීයක් කීය ද?

ii  කිලෝ එකක් කීය ද?

iii  ගෙඩි දෙකක් කීය ද?

iv  ගෙඩියක් කීය ද?

v  මිටියක් කීය ද?

## ✍ ක්‍රියාකාරකම 04

**පාඩමෙන් සොයමු. කියවමු.**

*பாடத்திலிருந்து கண்டுபிடிப்போம். வாசிப்போம்.*

i පොළේ තිබුණ එළවළු මොනවා ද?

ii පොළේ තිබුණ පලතුරු මොනවා ද?



iii මිටි දෙකක් ගත්තේ මොනවා ද?

iv දොඩම් ගෙඩියක් කීය ද?

v වම්බටු කිලෝ එකක් කීය ද?

## ✍ ක්‍රියාකාරකම 05



**බලා ලියමු. කියවමු.**

*பார்த்து எழுதுவோம். வாசிப்போம்.*

i අන්න - ....................

ii මෙන්න - ....................

iii දෙන්න - ....................

iv ගන්න - ....................

v දහයයි - ....................

vi විස්සයි - ....................

vii තිහයි - ....................

viii හතළිහයි - ....................



# වචන මාලාව.

| | | |
|---|---|---|
| පන්සීයක් | - | ஐநூறு |
| කිලෝ එකක් | - | ஒரு கிலோ |
| අඹ | - | மாம்பழம் |
| අන්නාසි | - | அன்னாசி |
| පැපොල් | - | பப்பாசிப்பழம் |
| පේර | - | கொய்யாப்பழம் |
| ඇපල් | - | அப்பிள் |
| මිදි | - | திராட்சை |
| කෙසෙල් ගෙඩි | - | வாழைப்பழம் |
| ගෙඩියක් | - | ஒரு காய் |
| ගෙඩි දෙකක් | - | இரண்டு காய்கள் |
| කීය ද? | - | எவ்வளவு? |



# 10

# යාපනේ මිදි

පුතා, එන්න බත් කන්න.

එනවා අම්මේ

ආ. . . මිදි

කවුද අම්මේ, මිදි ගෙනාවේ ?

තාත්තා ගෙනාවෙ පුතා.

තාත්තා මිදි ගෙනැල්ලා?

ආ. . . යාපනේ මිදි.

මම එක ගෙඩියක් කන්නම්

ෂා. . . හරි ම රසයි අම්මේ.

හා. . හා. . ඉස්සරවෙලා බත් කන්න

පස්සේ මිදි කන්න පුළුවන්.

යාපනේ මිදි හරි ම රසයි අම්මේ. . .


එ වගේ ම ගුණයි, හොඳයි.





## ✍ ක්‍රියාකාරකම 01

**රූප හා වචන ගළපමු. කියවමු.**


*படங்களையும் சொற்களையும் இணைப்போம். வாசிப்போம்.*

i  එන්න  කන්න

ii  ගෙනාව  හරි ම රසයි

iii  කවුද  ගෙනාවේ

iv  ඉස්සර වෙලා  කන්න

v  යාපනේ  හරි ම ගුණයි

## ✍ ක්‍රියාකාරකම 02



**වාක්‍ය හදමු. කියවමු.**

வசனங்களை அமைப்போம். வாசிப்போம்.





## ✍ ක්‍රියාකාරකම 03

**කියවමු. ලියමු.**

வாசிப்போம். எழுதுவோம்.

i




★ ............................................................

★ ............................................................


ii




★ ..........................................................

★ ............................................................


iii




★ ..........................................................


★ ..........................................................

iv




★ ..........................................................
★ ..........................................................

v





★ ..........................................................
★ ..........................................................

## ✍ ක්‍රියාකාරකම 04

**කියවමු.**

வாசிப்போம்.




## ✍ ක්‍රියාකාරකම 05

I **කියවමු.**

வாசிப்போம்.



i එන්න

කන්න

ii කන්නම්

කන්න පුළුවන්

iii රසයි

හරි ම රසයි

iv කවුද මිදි ගෙනාවේ?

තාත්තා මිදි ගෙනාවේ

v ඉස්සරවෙලා බත් කන්න

පස්සෙ මිදි කන්න

## II බලා ලියමු. කියවමු.

*பார்த்து எழுதுவோம். வாசிப்போம்.*



i තාත්තා

එන්න කන්න කන්නම්

ත් .......... .......... .......... .......... ..........

තා .......... .......... .......... .......... ..........

න් .......... .......... .......... .......... ..........

න .......... .......... .......... .......... ..........

ii අම්මේ

ම් .......... .......... .......... .......... ..........

මේ .......... .......... .......... .......... ..........

iii පස්සෙ

ස් .......... .......... .......... .......... ..........

සෙ .......... .......... .......... .......... ..........

අම්මේ

අ .......... .......... .......... .......... ..........

ඉස්සරවෙලා

ඉ .......... .......... .......... .......... ..........

එක එන්න එනවා

එ .......... .......... .......... .......... ..........

මිදි

මි .......... .......... .......... .......... ..........

දි .......... .......... .......... .......... ..........

රසයි

යි .......... .......... .......... .......... ..........

හරි

රි .......... .......... .......... .......... ..........

ගුණයි

ගු .......... .......... .......... .......... ..........

ණ .......... .......... .......... .......... ..........

# වචන මාලාව.

| | | |
|---|---|---|
| මිදි | - | திராட்சை |
| ගෙනාවේ | - | கொண்டுவந்தது |
| යාපනේ | - | யாழ்ப்பாண |
| එක ගෙඩියක් | - | ஒரு காய் |
| බත් | - | சோறு |
| කන්න | - | சாப்பிடுங்கள் |
| හරි ම රසයි | - | நல்ல சுவையானது |
| ගුණයි | - | குணமுள்ளது/குணமானது |
| හොඳයි | - | நல்லது |
| ඉස්සරවෙලා | - | முன்னதாக |
| ගෙනැල්ලා | - | கொண்டுவந்து |
| පුතා | - | மகன் |



# 11 පිපාසිත කපුටා

දවසක් කපුටෙකුට වතුර **තිබහක්** ඇති වුණා.

උඹ වතුර හොයන්න ඉගිලුණා.

හොයලා, හොයලා

මහන්සි වුණා.





පස්සෙ ගහක අත්තක වැහුවා.

ළඟ ගෙයක් **තියෙනවා** දැක්කා.

මිදුලේ කළයක් තිබුණා.

කළේ වතුර ඇති කියලා

කපුටා හිතුවා.



ඌ කළය උඩ වැහුවා.
වතුර තිබුණේ අඩියේ.
වතුර බොන්න මහන්සි වුණා.
ඒත් බොන්න බැරි වුණා.



ඌ හොඳ උපායක් යෙදුවා.
ගල් කැට එක දෙක
හොටෙන් ගෙනැල්ලා
කළයට දැම්මා.



කළේ වතුර ටික ටික උඩට ආවා.
කපුටා බඩ පිරෙන්න වතුර බිව්වා.



කපුටා කාක්. . කාක්. . කියලා
සතුටින් ඉගිලී ගියා.

## ✍ ක්‍රියාකාරකම 01



**කියවමු. යා කරමු.**

வாசிப்போம். இணைப்போம்.

i කපුටෙක් වතුර හොයා ගෙන ඉගිලුණා.



ii කපුටා කළය උඩ වැහුවා.



iii කපුටා වතුර බිව්වා.



iv ඌ ගල් කැට කළයට දැම්මා.



v කපුටා ගෙයක් ළඟ අත්තක වැහුවා.



## ✍ ක්‍රියාකාරකම 02



**කියවමු.**

*வாசிப்போம்.*

i වතුර හොයන්න ඉගිලුණා.

ii කළයක් තියෙනවා දැක්කා.

iii වතුර බොන්න හැදුවා.

iv ගල් කැට කළයට දැම්මා.


v වතුර උඩට ආවා. වතුර බිව්වා.

## ✍ ක්‍රියාකාරකම 03


**වගන්ති හදමු. කියවමු.**

*வசனங்களை அமைப்போம். வாசிப்போம்.*


i



ii




iii



## ✍ ක්‍රියාකාරකම 04

**පිළිතුර තෝරමු.**

விடை தேடுவோம்.

| |
|---|
| **කළයක්, සතුටින්, ගල් කැට, කළේ අඩියේ, කපුටෙක්,** |

i　වතුර හොයන්න ඉගිලුණේ මොකෙක් ද?

......................................

ii　මිදුලේ තිබුණේ මොකක් ද?

......................................

iii　වතුර තිබුණේ කොහේ ද?

......................................

iv　කළයට දැම්මේ මොනවා ද?

......................................

v　ඉගිලුණේ කොහොම ද?

......................................



## ✍ ක්‍රියාකාරකම 05

### I ලියමු. කියවමු.

எழுதுவோம். வாசிப்போம்.



i කාක් , කාක්

කාක් ........... ........... ........... ........... ...........

ii කළය, කළයට, කළයක්.

කළ ........... ........... ........... ........... ...........

iii උඩ, උඩට

උඩ ........... ........... ........... ........... ...........

iv ටික, ටික ටික, ටිකක්

ටික ........... ........... ........... ........... ...........

v ගහ, ගහක, ගහක්

ගහ ........... ........... ........... ........... ...........



## II කියවමු. ලියමු.
வாசிப்போம். எழுதுவோம்.

i වතුර **හොයන්න** ඉගිලුණා

**හොයන්න** .......... .......... .......... .......... ..........

ii වතුර **බොන්න** හැදුවා

**බොන්න** .......... .......... .......... .......... ..........

iii බඩ **පිරෙන්න** වතුර බිව්වා

**පිරෙන්න** .......... .......... .......... .......... ..........

iv ගල් කැට **ගෙනැල්ලා** දැම්මා

**ගෙනැල්ලා** .......... .......... .......... .......... ..........

v කාක් කාක් **කියලා** ඉගිලුණා

**කියලා** .......... .......... .......... .......... ..........



# වචන මාලාව.

| | | |
|---|---|---|
| තිබහක් | - | தாகம் |
| ඌ | - | அது |
| තියෙනවා | - | இருக்கிறது |
| කළය | - | குடம் |
| උපායක් | - | ஓர் உபாயம் |
| ගල් කැට | - | கற்துண்டுகள் |
| හොටෙන් | - | சொண்டினால் |
| ටික ටික | - | கொஞ்சம் கொஞ்சமாக |
| සතුටින් | - | மகிழ்ச்சியுடன் |



# 12 දුම්රියෙන් ගමනක්



තාත්තේ, කෝච්චිය
කීයට ද ?

පුතා, කෝච්චියට
තව වෙලාව
තියෙනවා.

අපි කෑම කමු.

පුතා අත හෝදගන්න.

අම්මෙ, කෑමට ගෙනාවේ
මොනවා ද?



ඉඳිආප්පයි, පරිප්පුයි,
සම්බෝලයි.

පුතා ඉක්මනට
කෑම කන්න.

"කරුණාවෙන් සවන්දෙන්න,

පළමුවෙනි වේදිකාවට දැන් පැමිණි යාල්දේවි දුම්රිය

පස්වරු 12.45ට යාපනය බලා පිටත් වේ.

එය යාපනය දක්වා සෑම දුම්රිය ස්ථානයක ම

නවත්වනවා ඇත."



ඔන්න පුතා අපේ කෝච්චිය.

පුතා, ඉක්මන් කරන්න.

කෑම කොළ කූඩෙට දාන්න.

බෑග් අතට ගන්න.





නගින්න පුතා, නගින්න.

පරෙස්සමින් නගින්න.

## ✍ ක්‍රියාකාරකම 01

**වචන ගළපමු. කියවමු.**

சொற்களை இணைப்போம். வாசிப்போம்.





අත්



කෑම



කුඩේට



නිවේදනයට



දුම්රියට

නගින්න

දාන්න

කන්න

සවන්දෙන්න

හෝදන්න

## ✍ ක්‍රියාකාරකම 02



### උපදෙස් කියවමු.

அறிவுரைகளை வாசிப்போம்.

i 

කෑමට පෙර අත් සෝදන්න.

ii 

කෑම කොළ කුඩේට දාන්න.

iii 

කරුණාවෙන් සවන්දෙන්න.

iv 

බෑග් අතට ගන්න.

v 

පරෙස්සමින් නගින්න.

## ✍ ක්‍රියාකාරකම 03

**සොයමු. කියවමු.**

தேடுவோம். வாசிப்போம்.

| |
|---|
| **යාපනයට, නිවේදනයට, 12.45 ට, ඉඳිආප්ප, යාල්දේවි.** |

i අම්මා කෑමට ගෙනාවේ ................

ii මේ දුම්රියේ නම ................

iii දුම්රිය පිටත් වන්නේ පස්වරු ................

iv මේ දුම්රිය යන්නේ ................

v සවන්දෙන්නේ ................



## ✍ ක්‍රියාකාරකම 04

**වාක්‍ය හදමු. කියවමු.**

வசனங்களை அமைப்போம். வாசிப்போம்.



| |
|---|
| **කුඩෙට, අත, දුම්රියට, කෑම, අතට** |

i පුතා, ...................................... හෝදන්න

ii පුතා, ...................................... කන්න.

iii කෑම කොළ ...................................... දාන්න.

iv බෑග් ...................................... ගන්න.

v පරෙස්සමින් ...................................... නගින්න.

ලියමු.

எழுதுவோம்.



| | | | |
|---|---|---|---|
| ක | - | කන්න | ක |
| කා | - | වේදිකාවට | කා |
| කැ | - | කැම | කැ |
| කී | - | කීයට ද? | කී |
| කු | - | කුණු | කු |
| කූ | - | කූඩෙ | කූ |
| කො | - | කොළ | කො |
| කෝ | - | කෝච්චිය | කෝ |
| ක් | - | ඉක්මනට | ක් |

# වචන මාලාව.

| | | |
|---|---|---|
| කරුණාවෙන් | - | தயவுசெய்து |
| සවන්දෙන්න | - | செவிமடுங்கள் |
| දුම්රිය | - | புகைவண்டி |
| ගමනක් | - | ஒரு பிரயாணம்/பயணம் |
| වේදිකාව | - | மேடை |
| පළමුවෙනි | - | முதலாம் |

